# කුරුළු පවුල



එස්. එම්. සෙහස්නා දිනුල්යා සමරකෝන්

# කුරුළු පවුල

**එස්. එම්. සෙහස්නා දිනුල්යා සමරකෝන්**

**කතෘ**

**එස්. එම්. සෙහස්නා දිනුල්යා සමරකෝන්**

**සිතුවම්**

කතෘගේ වෙනත් කෘති

- සෙල්ලම් ගෙදරට ආව පුංචි අමුත්තා

මහාමායා බාලිකා විද්‍යාලය
**2 (ඉ) - ශ්‍රේණිය**

**2025 . 02. 08**

**ISBN – 978 – 624 – 208 – 506 – 7**

# පිදුම

**සිප් කිරි පොවා මා පසුපසින් සිට**

**දිරිගන්වමින්**

**මගපෙන්වූ ආදරණීය**

**ගුරු මෑණියන්ටද,**

**ජීවය දී,**

**ගුණධර්ම කියාදෙමින්,**

**ආදරයෙන් මා රැකබලා ගන්නා,**

**මා දයාබර දෙමාපියන් වෙතද**

**ගෞරවයෙන් පුදමි……..**

# පෙරවදන


සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ගන්ථකරණය තුලින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුල පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසැල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත්වීම සුවිශේෂ සිද්ධවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසැල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථධස්සී මිහිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රධාය රටතුල යලි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වාදෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසැල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිණිය වශයෙන් මා හට අභිමාණයක් වන අතරම පාසැලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වේ. ජීවිතය මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛණ කරනයට යොමුවීමේ ප්‍රතිපලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,
ශෂිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

එක කැලෑවක ගසක ලස්සන කුරුලු කූඩුවක් තිබුණා. මේ කුරුලු කූඩුවේ කුරුලු අම්මයි, කුරුලු තාත්තායි, කුරුලු පැටවු තුන් දෙනෙකුයි ජීවත් වුණා. මේ කුරුලු පවුල හරිම සතුටින් කාලය ගත කළා.



කුරුලු දෙමව්පියෝ කෑම සොයන්න උදෙන්ම පිටත් වුණා. පිටත් වෙන්න කලින් කුරුලු පැටවුන්ට පරිස්සමෙන් ඉන්න කියා අවවාද කරන්නට කුරුලු අම්මයි කුරුලු තාත්තයි අමතක කළේ නෑ.



**කූඩුවේ සිටින පුංචි කුරුලු පැටවු ගී ගැයුවා. අත්තටු ගසමින් නැටුවා. පුංචි පැටවු තුන් දෙනා සමගියෙන් සෙල්ලම් කළා.**



එක දවසක් කැලෑවේ සිටි නපුරු නයිහාමි කෙනෙකුට පුංචි කුරුලු පැටවු ගී ගයනවා ඇසුණා. නයිහාමී හෙමින් හෙමින් කුරුලු පැටවුන් සිටි කූඩුවට ළං වුණා.



කවදාකවත් දැකලා නැති මේ අමුත්තා දැක්ක කුරුලු පැටවු බය වුණා. අනතුරක් කියලා දැනුණු කුරුලු පැටවුන් අඬන්න පටන් ගත්තා.



එතනින් ගිය මුගටිරාළ කෙනෙකුට කුරුලු පැටවුන් අඩන ශබ්දය ඇසුණා. කුරුලු පැටවුන්ට අනතුරක් බව මුගටිරාළට තේරුම් ගියා. මුගටිරාළට දුක හිතුණා.



මුගටිරාළ කුරුලු කූඩුව ළගට ආවා. මුගටිරාළ කුරුලු පැටවුන් ගිලින්නට කූඩුවට ඇදෙන නයිහාමිව දැක්කා.

අහිංසක කුරුලු පැටවුන් තවත් හයියෙන් අඩන්න පටන් ගත්තා.



අහිංසක කුරුලු පැටවුන් බේරා ගන්න හිතපු මුගටිරාළ නයිහාමිගෙ ඇගට පැන්නා. නයිහාමීත් මුගටිරාළ සමග රණ්ඩු කළා. අන්තිමේදී පැරදුණු නයිහාමී මුගටිරාළට බයේ කැලයට රිංගුවා.



**සවස කෑම සොයාගෙන කුරුලු මව්පියන් කූඩුවට ආවා. කුරුලු පැටවු කියපු කතාව ඇසූ කුරුලු මව්පියන් මුගටිරාළට ස්තූති කළා.**



බඩගින්නේ සිටි පැටවුන්ට කෑම කැවූ කුරුලු මව්පියන් පැටවුන් තුරුලු කර ගත්තා. කුරුලු අම්මයි කුරුලු තාත්තායි එදා රෑ නින්දට ගියේ ඉක්මනින් පැටවුන්ට ඉගිලෙන්න කියා දෙන බවට පොරොන්දු වෙලයි.



**නිමි.**

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවක් සාහිත්‍ය නිර්මාණ කරණය විහවතා කොට ගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව **2014** වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසැල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘති යටතේ මේ වන විට ලේඛක අංකුර හැටසහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍යය කෙතේ රෝපනය කිරිමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරුපසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසැල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන් ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් කැප කිරිමට ජාතිය ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය. මානව දැණුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බව අනර්ථකාරි මෙන්ම සමාජය තුල විවිධ ගැටළු ප්‍රශ්ණ නිර්මාණය වීමට හේතුවී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වේ. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතක තාක්ෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසැල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘතින් රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුලින් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,
සෙනවිරත්න මහලේකම

ISBN – 978 – 624 – 208 – 506 - 7